JMC vLearning
"your virtual learning partner"

# බදුකරණය හැඳින්වීම

## AAT අදියර III
## CPT - සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

ඉන්දික ජයවීර
B.Sc. (Mgt), ACA, AAT Finalist, Reading for MBA

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# 1. බදුකරණය හැඳන්වීම.

බද්දක් යනු ------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------------------

**බදුකරණයේ අරමුණු (Objective of the Taxations)**

රටක ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකි වියදම් වර්ග දෙකකි. එනම්, ප්‍රාග්ධන වියදම් හා අයභාර වියදම් වේ. මෙම ප්‍රධාන වියදම් ආවරණය කර ගැනීම සඳහා රජයකට ආදායම් අවශ්‍ය වනු ඇත. රජය විසින් මෙම වියදම් ප්‍රතිපූර්ණය කර ගන්නා මූලික ආදායම් මාර්ගය වනුයේ බදු ආදායමයි.

**බදුකරණයේ කාර්යයන් (Function of Taxations)**

බදුකරණයේ මූලික කාර්යයන් ප්‍රධාන කොටස් 03 කි.

01. ප්‍රාථමික කාර්යයන් (Primary function)

02. ආර්ථික කාර්යයන් (Economic function)

03. සාමාජීය කාර්යයන් (Social function)

**01. ප්‍රාථමික කාර්යයන් (Primary function)**

------------------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------------------

**රාජ්‍ය වියදම් (Public Expenditure)**

රාජය විසින් ගාස්තු රහිතව හා අවම ගාස්තු යටතේ රටේ පුරවැසියන්ගේ සුභ සාධනයට විවිධ සේවාවන් සපයනු ලබයි. එවැනි සේවානම්,

- ❖ ------------------------------------------------------------------------------------
- ❖ ------------------------------------------------------------------------------------
- ❖ ------------------------------------------------------------------------------------
- ❖ ------------------------------------------------------------------------------------
- ❖ ------------------------------------------------------------------------------------

# 2. ආර්ථික කාර්යයන් (Economic Functions)

- ➢ දේශීය හෝ විදේශීය ආයෝජන යොමු කල යුතු දිශාවන් සැකසීම.

------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

JMC vLearning "your virtual learning partner"

- විදේශීය තරඟකරුවන්ගෙන් දේශීය කර්මාන්ත ආරක්‍ෂා කර ගැනීම.

  ------------------------------------------------------------------------------------------------

  ------------------------------------------------------------------------------------------------

## 3. සමාජයීය කාර්යයන් (Social Functions)

- සමාජය විසින් අනුමත නොකරන කාර්යයන් අධෛර්‍යමත් කිරීම.
  උදා: දුම්වැටි පරිහරණය, සූදු ඔට්ටු ඇල්ලීම.

- සමාජය විසින් අනුමත කරනු ලබන කාර්යයන් ධෛර්යමත් කිරීම.
  උදා: ඉතිරි කිරීම, පර්යේෂණ සංවර්ධන කාර්යයන්

- ආදායම් විෂමතාව අවම කිරීම.
  ඉහල ආදායම් උපයන පුද්ගලයන්ගෙන් බදු ලෙස ලබා ගෙන පහළ ආදායම් උපයන්නන් හට සහන ලබා දීම.

බදුකරණය අධ්‍යයනය කිරීමේ දී පහත සඳහන් කාරණා පිළිබඳව මනා අවබෝධයක් අධ්‍යයනය කරන්නාට තිබිය යුතුය.

1. බදුකරණයේ මූලධර්ම (Principals of Taxations)
2. බදු වර්ගීකරණයන් (Classification of Taxations)
3. බදු අධිකාරීන් (Tax Authorities)
4. බදුකරණයේ නීතිමය රාමුව (Legal Framework of Taxations)
5. බද්ද පැනවීම (Impose of Tax)
6. වාසික නිර්වාසිකභාවය (Residency and Non Residency)

### 1. බදුකරණයේ මූලධර්ම (Principals of Taxations)

1.1 සාධාරණත්වය (Equity)

බදු ගෙවීමේ හැකියාව මත බද්ද ගෙවන්නාගෙන් බදු අයකළ යුතු බවයි. එනම්, ඉහල ආදායම් උපයන්නන්ගෙන් ඉහළ බදු ප්‍රමාණයකුත්, පහළ ආදායම් උපයන්නන්ගෙන් පහළ අනුපාතයකතුත් යටතේ බදු අයකල යුතුය යන්නයි.

1.2 වර්ධක බව (Progressivity)

මෙය තිරස් සාධාරණත්වය මූලධර්මය සහ ගෙවීමේ හැකියාව මත බදු අය කළ යුතුය යන්නයි.

JMC Learning "your virtual learning partner"

1.3 රැස්කිරීමේ පිරිවැය අවම වීම (Economy)

බදු අයකර ගැනීමට දරනු ලබන පිරිවැය අවම කරගත යුතු අතර එමඟින් උපරිම ආදායමක් රජය උපයාගත යුතුය.

1.4 නිශ්චිත බව (Certainty)

එක් එක් තැනැත්තා විසින් ගෙවිය යුතු බදු මුදල, ගෙවිය යුතු දිනය, ගෙවිය යුතු ක්‍රමය සහ ගණනය කිරීමේ පදනම සහ ක්‍රමය යනාදිය. ඉතාමත් පැහැදිලි හා නිශ්චිත විය යුතුය.

1.5 ප්‍රමාණවත් බව (Adequacy)

එකතු කර ගන්නා බදු මුදල අපේක්ෂිත රාජ්‍ය වියදම් පියවා ගැනීම සඳහා ප්‍රමාණවත් විය යුතුය.

1.6 සරල බව (Simplicity)

බදු ක්‍රමය ඉතා සරල පහසු සහ තේරුම් ගැනීමට හැකි ප්‍රතිපත්ති වලින් සමන්විත යුතුය.

1.7 පුළුල් පරාසයක් වීම (Broad Based)

තනි තනි පුද්ගලයන්ගේ බදු බර අවම කර ගැනීම සඳහා සමාජයේ විවිධ කොටස් සහ ජන කොටස් ආවරණය වන ලෙසින් වූ පුළුල් බදු ක්‍රමයක් පැවතිය යුතුය.

1.8 ස්ථාවරත්වය (Stability)

රටක බදු ක්‍රම වේදය නිතර නිතර වෙනස් නොකල යුතු බවයි.

1.9 පහසුබව හා ස්වේච්චා අනුකූලතාවය (Convenience and voluntary compliance)

පනවනු ලබන බදු, බදු ගෙවන්නාට ගෙවීමට පහසු විය යුතු අතර, තම කැමැත්තෙන්ම ගෙවීමට අවනත කරවිය යුතුය.

## 2. බදු වර්ගීකරණය (Classification of Taxes)

බදු පුළුල් ලෙස සෘජු හා වක්‍ර ලෙස වර්ගීකරණය කළ හැකිය.

2.1 සෘජු බදු (Direct Taxes)

බදු ගෙවන්නා විසින් බදු උපයාගත් ආදායම් මත ගෙවීම සිදු වේ. බදු ගෙවන්නා සහ බදු බර දරන්නා දෙදෙනාම එකම පුද්ගලයෙකි. විතැන් කළ නොහැකිය.

උදාහරණ: ආදායම් බදු

JMC vLearning "your virtual learning partner"

2.2 වක්‍ර බදු (Indirect Taxes)

අවසාන පාරිභෝජනය මත අය කරන බදු වේ. බදු ගෙවන්නා සහ බදු බර දරන්නා පුද්ගලයින් දෙදෙනෙකු වේ. විතැන් කළ හැකිය.

උදාහරණ: එකතු කළ අගය මත බදු (VAT)

**ප්‍රශ්නය 01**

පහත බදු වර්ග සෘජු හා වක්‍ර ලෙස වර්ගීකරණය කරන්න.

| බදු වර්ගය | සෘජු | වක්‍ර |
|---|---|---|
| ආදායම් බද්ද | | |
| එකතු කළ අගය මත බද්ද | | |
| රේගු බද්ද | | |
| මුද්දර බද්ද | | |
| ඔට්ටු ඇල්ලීමේ බද්ද | | |
| ලොතරැයි බද්ද | | |

## 3. ශ්‍රී ලංකාවේ බදු අධිකාරීන් (Tax Authority in Sri Lanka)

3.1 දේශීය ආදායම් දොපාර්තමේන්තුව (Inland Revenue Department)

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් පහත බදු වර්ග පරිපාලනය කරයි.

- ආදායම් බද්ද (Income Tax)
- එකතු කළ අගය මත බද්ද (VAT)
- 2000 අංක 12 දරණ මුද්දර බදු පනත යටතේ මුද්දර බද්ද

3.2 පළාත් ආදායම් දෙපාර්තමේන්තුව (Provincial Revenue Department)

පළාත් ආදායම් දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් පහත බදු වර්ගයන් පරිපාලනය කරනු ලබයි.

- 1982 මුද්දර බදු පනත යටතේ මුද්දර බද්ද (Stamp duty)
- ත්‍යාග තරඟ බදු (Betting tax)
- ඛනිජ බදු (Lottery tax)
- ඖෂධ හා රසායන ද්‍රව්‍ය බදු (Drug and Chemical tax)

3.3 සුරා බදු දෙපාර්තමේන්තුව

3.4 රේගු දෙපාර්තමේනතුව

## 4. බදුකරණයේ නීතිමය රාමුව (Legal Framework of Taxation)

විෂය නිර්දේශය තුළ ආවරණය වන විවිධ බදු වර්ග විවිධ පනත් අනුව පරිපාලනය වන අතර ඒ ඒ වෙන් වෙන් වූ පනත් වලට අමතරව පසුව ඇති වූ සංශෝධන හා එම පනත යටතේ නිකුත් කළ ගැසට් නිවේදනය ද සැළකිල්ලට ගත යුතුය.

JMC Learning "your virtual learning partner"

4.1 ආදායම් බද්ද (Income Tax)

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත සහ මෙම පනත යටතේ නිකුත් කරන ලද ගැසට් නිවේදන මඟින් ආදායම් බද්ද පාලනය වේ. මෙම පනත 2018 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වේ. 2018 අප්‍රේල් 01 දිනට පෙර ආදායම් බදු සඳහා 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනත ක්‍රියාත්මක විය.

4.2 එකතු කළ අගය මත බද්ද (Value Added Tax)

2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනත, පසුව වූ සංශෝධනයන් සහ පනත යටතේ ගැසට් නිවේදනයන් මඟින් පාලනය වේ.

4.3 මුද්දර ගාස්තු (Stamp Duty)

2006 අංක 12 දරණ මුද්දර ගාස්තු පනත, එහි පසු සංශෝධනයන් සහ පනත යටතේ නිකුත් කර ඇති ගැසට් නිවේදනයන් මඟින් මුද්දර ගාස්තු පාලනය වේ.

**5. ආදායම් බද්ද පැනවීම (Imposed of Income Taxes)**

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 02 වන වගන්තිය මඟින්, බදු අය කළ හැකි ආදායමක් ලබන තැනැත්තෙකු හෝ අවසාන රඳවා ගැනීමේ ගෙවීමක් ලබන තැනැත්තෙකු (Person) මත බදු වගකීම පනවයි.

5.1 ගෙවීමට යටත් වන්නේ කවරෙකුද?

අදාල වර්ෂය සඳහා බදු අයවන ආදායම් ඇති තැනැත්තා හෝ අවසාන රඳවා ගැනීමේ ගෙවීමක් ලබන තැනැත්තෙකු.

5.2 බදු අයවන ආදායම යනු කුමක්ද?

| | |
|---|---|
| තැනැත්තෙකුගේ, | |
| සේවා නියුක්ත ආදායම | xxx |
| ව්‍යාපාර ආදායම | xxx |
| ආයෝජන ආදායම | xxx |
| අනෙකුත් ආදායම | xxx |
| මුළු තක්සේරු කල ආදායම (Total assessable income) | xxx |
| (-) සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන - 52 වගන්තිය (Qualifying payments & relief) | (xx) |
| බදුවන ආදායම (Taxable income) | xxx |

JMC vLearning "your virtual learning partner"

## 5.3 බදු ගණනය කල යුත්තේ කෙසේද? (Calculation of Tax Liability)

| | | |
|---|---|---|
| බදුවන ආදායම අදාල බදු අනුපාතය (පළමුවන උපලේඛනයේ පරිදි) = | xxx | |
| (-) 80 වන වගන්තිය යටතේ විදේශ බදු බැර | (xx) | බදු බැර (Tax credit) |
| (-) වෙනත් ඉඩ දෙන බදු බැර | (xxx) | |
| ගෙවිය යුතු ඉතිරි බදු වගකීම (Balance tax payable) | xxx | |

යම් ආදායම් මූලාශ්‍රයක් මත රඳවා ගැනීමේ බදු අඩුකර ඇත්නම් සහ, වගන්තිය 88 ට අනුව එය අවසාන රඳවා ගැනීමේ බද්දක් ලෙස අර්ථකතනය කර ඇත්නම්, එවැනි ආදායම් මූලාශ්‍ර නැවත බදු ගණනයේදී, බදු වන ආදායම (Taxable income) සැලකිල්ලට නොගනී.

## 5.4 ආදායම් බදු ගෙවීමට යටත් වන්නේ කවරෙක්ද?

පහත පුද්ගලයන් බදු ගෙවීමට යටත් වේ.

1. බදු අය කළ හැකි ආදායමක් ලබන තැනැත්තෙකු,
2. අවසාන රඳවා ගැනීමේ ගෙවීමක් ලබන තැනැත්තෙකු,

දේශීය ආදායම් බදු පනතේ 195 වගන්තිය අනුව "තැනැත්තා" යන්න පහත පරිදි නිර්වචනය කර ඇත.

"තැනැත්තා" (Person) යන්නෙන් තනි **<u>පුද්ගලයෙකු</u>** (Individual) හෝ **<u>අස්ථිත්වයක්</u>** (Entity) අදහස් වන අතර,

- සංස්ථාගත හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක්
- පොල්ම:කරුවෙක්
- රාජ්‍ය නොවන සංවිධානයක් සහ
- පුණ්‍යයාතනයක් ඊට ඇතුලත් වේ. (වගන්තිය 195)

"අස්ථිත්වය" යන්නෙන් යම් සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ භාරයක් අදහස් වන නමුත් යම් පුද්ගලයෙකු ඊට ඇතුලත් නොවේ.

ඒ අනුව තැනැත්තා යන්නට,

- තනි පුද්ගලයෙකු
- හවුල් ව්‍යාපාරයක්
- භාරයක්
- සංස්ථාගත හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක්
- පොල්ම:කරුවෙක්
- රාජ්‍ය නොවන සංවිධානයක්
- පුණ්‍යයාතනයක් ඇතුලත් වේ.

## 5.5 ආදායම් බද්ද ගණනය කළ යුත්තේ කුමන කාල පරාසයකට වරක්ද?

සෑම තක්සේරු වර්ෂයක් (year of assessment) සඳහාම ආදායම් බද්ද ගණනය කළ යුතුය.

JMCvLearning "your virtual learning partner"

බදු කාලපරිච්ඡේදය (year of assessment) **<u>තක්සේරු වර්ෂය</u>** යනුවෙන් හඳුන්වයි.

"තක්සේරු වර්ෂය" යන්නෙන් යම් වර්ෂයක අප්‍රේල් මස පළමුවන දිනෙන් ආරම්භ වී ඉක්බිතිව එළඹෙන වර්ෂයේ මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන මාස දොළහක කාලසීමාව අදහස් වේ.

උදා: ලෙස, 2021/04/01 දිනෙන් ආරම්භ වී 2022/03/31 න් අවසන් වන මස 12 ක කාලපරිච්ඡේදය 2021/2022 තක්සේරු වර්ෂය ලෙස හඳුනාගත හැකිය.

**<u>Special Note</u>**

නමුත්, භාරයක් හෝ සමාගමක් එහි තක්සේරු වර්ෂය වෙනස් කිරීම සඳහා ආදායම් බදු කොමසාරිස්වරයාගෙන් ඉල්ලා සිටිය හැකිය. [20(2) වගන්තිය] අවසර දුනහොත් ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 වන දක්වා තක්සේරු වර්ෂයක් ලෙස සැලකිල්ලට ගනී.

5.6 කුමක් මත බද්ද ගණනය කල යුතුද?

- ➢ බදුවන ආදායම මත බද්ද ගණනය කල යුතුය.

| | | |
|---|---|---|
| සේවා නියුක්ත ආදායම | | xx |
| ව්‍යාපාර ආදායම | | xx |
| ආයෝජන ආදායම | | xx |
| අනෙකුත් ආදායම | | xx |
| මුළු තක්සේරු කල ආදායම | = | xx |
| (-) <u>52 වන වගන්තිය</u> සුදුසුකම් ලබන ගෙවීම සහ සහන | | (xx) |
| බදුවන ආදායම | = | xxx |

බදුවන ආදායම X අදාල බදු අනුපාතයන් (I වන උපලේඛනය පරිදි) = XXX

5.7 වාසික නීතිය (Residence Rule)

- ➢ බදු අරමුණ සඳහා යම් තැනැත්තෙකු වාසික හෝ නිර්වාසික ලෙස හඳුනාගත යුත්තේ ඇයි?

A. වාසික තැනැත්තෙකු සම්බන්ධයෙන් වන විට, මූලාශ්‍රය කුමන ස්ථානයකින් පැන නැගුන ද එනම් ගෝලීය ආදායම මත. ශ්‍රී ලංකාවේදී බද්දට යටත් වේ.

B. නිර්වාසික තැනැත්තෙකු, සම්බන්ධයෙන් වන විට, එම තක්සේරු වර්ෂය තුල එම තැනැත්තා ශ්‍රී ලංකාවෙන් පමණක් උපයන ආදායම මත පමණක් ශ්‍රී ලංකාවේදී බද්දට යටත් වේ.

JMC vLearning "your virtual learning partner"

වාසික නීතිය

- තනි පුද්ගලයෙකු සම්බන්ධව වන විට
- හවුල් ව්‍යාපාරයක් සම්බන්ධ වන විට
- යම් භාරයක් සම්බන්ධව වන විට
- යම් සමාගමක් සම්බන්ධව වන විට

<u>තනි පුද්ගලයෙකු සම්බන්ධ වන විට</u>,

1. ශ්‍රී ලංකාව තුළ වාසය කරයි නම්,

   මෙමඟින් අදහස් කරනුයේ,

   - ශ්‍රී ලංකව තුල ස්ථිර නිවසක් තිබීම
   - තැනැත්තාගේ පවුල (Family) ලංකාවේ ජීවත් වීම.

   යන කරුණු මත ශ්‍රී ලාංකික වාසය කිරීම තීරණය වේ.

2. එම වර්ෂය තුල ශ්‍රී ලංකාව තුළ කායිකව සිටී නම් සහ කායිකව සිටීමේ කාල සීමාවේ හෝ කාලසීමාවල මුළු එකතුව එම වර්ෂය තුල ආරම්භ වන හෝ අවසන් වන යම් මාස දොළහක කාලසීමාවක් තුලදී දින 183 ක් හෝ ඊට වැඩි ගණනක් වේ නම්,

3. එම පුද්ගලයා ශ්‍රී ලංකාවේ රජයේ සේවකයෙකු හෝ නිළධාරියෙකු වේ නම් සහ එම පුද්ගලයාගේ කාලත්‍රයා එම වර්ෂය තුළ විදේශයක ඇත්නම්,

4. වෙළඳ නැව් පනතේ අර්ථානුකූලව, ශ්‍රී ලංකා නෞකාවක සේවයේ නියුක්තව සිටින්නේ නම්, ඔහු එසේ සේවයේ නියුක්තව සිටින කාලසීමාව තුල,

ඉහත එක් නිර්ණායකයක්වත් සම්පූර්ණ වන්නේ නම්, එම පුද්ගලයා එම තක්සේරු වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ බදු කටයුතු සඳහා වාසික පුද්ගලයෙකු සේ සැලකේ.

<u>හවුල් ව්‍යාපාරයක් සම්බන්ධව වන විට,</u>

1. ශ්‍රී ලංකාව තුළ පිහිටුවන ලද්දේ නම්,
2. යම් තක්සේරු වර්ෂයක් තුල යම් අවස්ථාවකදී එම හවුල් ව්‍යාපාරයේ කටයුතු කළමනාකරණය සහ පාලනය ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක කර ඇත්නම්,

ඉහත එක් නිර්ණායකයක්වත් සම්පූර්ණ වන්නේ නම්,එම හවුල් ව්‍යාපාරය එම තක්සේරු වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ වාසිකයෙකු වේ.

<u>භාරයක් සම්බන්ධව වන විට,</u>

1. ශ්‍රී ලංකාව තුළ පිහිට වූයේ නම්,
2. තක්සේරු වර්ෂයේ යම්, අවස්ථාවක එම භාරයේ භාරකරු ශ්‍රී ලංකාව තුල වාසිකව සිටියේ නම්,

හෝ,

JMC vLearning "your virtual learning partner"

3. තක්සේරු වර්ෂයේ යම් අවස්ථාවක ශ්‍රී ලංකාවේ වාසික තැනැත්තෙකු තනිව හෝ වෙනත් තැනැත්තෙක් සමඟ එක්ව නැතහොත් සෘජුව වම හෝ එක් අස්ථිත්වයක් හෝ එකකට වැඩි අතරමගදී අස්ථිත්වයක් මඟින් හෝ වුව එම භාරයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව තීරණ මෙහෙයවන්නේ නම් හෝ මෙහෙයවිය හැකි නම්,

ඉහත එක් නිර්ණායකයක්වත් සම්පූර්ණ වන්නේ නම්, එම භාරය එම තක්සේරු වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ වාසිකයෙකු වේ.

<u>සමාගමක් සම්බන්ධව වන විට,</u>

1. ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර හෝ පිහිටුවා ඇත්නම්,
2. එය ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇත්නම් හෝ එහි ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවේ පිහිටුවන ඇත්නම් හෝ
3. තක්සේරු වර්ෂයේ යම් අවස්ථාවකදී එම සමාගමේ කටයුතු කළමනාකරණය සහ පාලනය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කර ඇත්නම්,

ඉහත එක් නිර්ණායකයක්වත් සම්පූර්ණ වන්නේ නම්, එම සමාගම එම තක්සේරු වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ වාසිකයෙකු වේ.

**<u>බදු සැලසුම්කරණය, බදු ගෙවීම මඟහැරීම හා බදු ගෙවීමෙන් වැළකීම</u>**

බදු සැලසුම්කරණ යනු,

රජය විසින් නියම කර ඇති ආදායම් බදු නීතිරීති මඟින් අවසර දී ඇති සියළුම අඩු කිරීම්, දීමනා වට්ටම්, සීමාවන් යනාදිය උපරිම ලෙස භාවිතා කිරීමෙන් බදු වගකීම අවම කිරීමයි.

බදු සැලසුම්කරණයේ ප්‍රතිලාභයන්,

1. පවතින් සියළු අඩු කිරීම්වලින් පූර්ණ ප්‍රතිලාභ ලබා ගනිමින් ගෙවිය යුතු බදු ප්‍රමාණය අඩු කිරීමයි.
2. ඉතිරි කරන මුදල් ආයෝජනය කිරීමට සහ අතිරේක ආදායමක් උපයා ගැනීමට භාවිතා කළ හැක.
3. බදු වගකීමක් ඇති බව කල්තියා දැන ගැනීමෙන් අනවශ්‍ය ආතතිය හා අවිනිශ්චිතතාව දුරුකර දැනුවත් තීරණ ගත හැකි නිසා අවසානයේ මනසේ සාමය ලබාගත හැකිය.

**බදු මග හැරීම යනු,** යම් පුද්ගලයෙකුගේ බදු වගකීම අවම කිරීම සඳහා පවතින නීති රාමුව තුල ඔහුගේ මූල්‍ය කටයුතුවල සැකැස්මකි. දේශීය ආදායම් පනත යටතේ සියළුම නීත්‍යානුකූල අඩු කිරීම් ලබා ගැනීමෙන් ව්‍යාපාරවලට බදු මඟ හැරිය හැකිය. මෙය නීත්‍යානුකූල කටයුත්තකි. නමුත් සාදාචාර විරෝධීය.

**බදු පැහැර හැරීම යනු,** හිතාමතා බදු අධිකාරීන් රවටා බදු නොගෙවා සිටීමට කරුනු ලබන සැලැස්මකි. එය අනිවාර්යය වරදකි. සාදාචාර විරෝධීය.

බදු පැහැර හැරීම සඳහා උදාහරණ නම්,

- ආදායම් වාර්තා නොකිරීම
- වියදම් වැඩියෙන් වාර්තා කිරීම

| **බදු සැලසුම් කිරීම** | **බදු මඟ හැරීම** | **බදු පැහැර හැරීම** |
|---|---|---|
| නීත්‍යානුකූලය | නීත්‍යානුකූලය | නීතිවිරෝධීය |
| සදාචාරාත්මකය | සදාචාරාත්මකය නොවේ. | සදාචාරාත්මකය නොවේ. |
| නීතිමය බලය පරාජය කිරීමේ අදහසක් නැත. | නීතිමය බලය පරාජය කිරීමේ අදහසක් තිබේ. | ආදායම හා වියදම් වැරදි ලෙස අර්ථ දැක්වීම සඳහා විකෘති කිරීම. |
| බදු වගකීම ඇති වීමට පෙර සැලසුම් කිරීම සිදු කරයි. | බදු වගකීම ඇති වීමට පෙර බදු මඟ හැරීම සැලසුම් කරයි. | බදු වගකීම පැන නැඟීමෙන් පසු බදු ගෙවීම පැහැර හැරීම සහ සම්බන්ධ වේ. |
| වෘත්තීයභාවය ප්‍රවර්තනය කරයි. | අල්ලස් දීම දිරිමත් කරයි. | අල්ලස් දීම දිරිමත් කරයි. |

35 වන වගන්තියට අනුව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට බදු මඟ හැරීම හෝ බදු පැහැර හැරීමක් හැඟී ගියහොත්, අදාළ තක්සේරු වර්ෂයේ අවසාන දිනයේ සිට වසර පහක් (05) ඇතුළත තක්සේරුවක් කරනු ලැබිය හැකිය.

185 වන වගන්තිය අනුව, චේතනාත්මකව මඟහරිනු ලබන හෝ මඟහැරීමට කරනු ලබන හෝ ගෙවන ලද බදු ආපසු ලබා ගැනීම සඳහා හිමිකම නොමැතිව චේතනාත්මකව සහ වංචනික ලෙස හිමිකම් කියාපාන යම් තැනැත්තෙකු, වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන 10 නොඉක්මවන දඩයක් හෝ වසර දෙකක් නොඉක්මවන ලබන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමකට හෝ එම දඬුවම් දෙකටම ලක් කිරීමට බලය ඇත.